විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව
ஓய்வூதியத் திணைக்களம்
DEPARTMENT OF PENSIONS
ශ්‍රී ලංකා විශ්‍රාම
இலங்கை ஓய்வு
Sri Lanka Pensions

පරපුරක අභිමානය   தலைமுறையொன்றின் பெருமிதம்   Pride of a Generation

මගේ අංකය / எனது இல. / My No.: විශ්‍රාම වැටුප් උපදෙස් ලිපි අංක 04/2019 (i)   ඔබේ අංකය / உமது இல. / Your No.: ..........   දිනය / திகதி / Date: 2019.08.19

සියළුම දිස්ත්‍රික් ලේකම්වරුන්,
සියළුම ප්‍රාදේශීය ලේකම්වරුන්,

**<u>2018.01.01ට පෙර සේවය අවසන් වී ඇති අමාත්‍යාංශ ලේකම්වරුන් හා සමාන්තර වැටුප් තලයන්හි සේවය කල නිලධාරීන් වෙනුවෙන් රු.25,000ක විශේෂ දීමනාවක් විශ්‍රාම වැටුපට එකතු කිරීම.</u>**

උක්ත කරුණට අදාලව දීමනාව ගෙවීම සම්බන්ධව මවිසින් නිකුත් කරන ලද 2019.04.02 දිනැති විශ්‍රාම වැටුප් උපදෙස් ලිපි අංක 04/2019 හා ඊට අනුරූප උපදේසයන්ට අමතර වශයෙනි. මේ සඳහා ඉදිරිපත් කල යුතු අයදුම්පත ඇමුණුම 01 වශයෙන් යොමු කරමි.

02. 2019.07.01 දිනට පෙර පහත තනතුරු දරමින් සිට, එකී තනතුරෙන්ම විශ්‍රාම ගන්වනු ලැබූ නිලධාරීන්ට 2019.07.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි රු.25,000 ක මාසික දීමනාවක් විශ්‍රාම වැටුපට එකතු කිරීම සඳහා අංක අමප/19/1081/101/028-I හා 2019.05.28 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය මඟින් අනුමැතිය හිමි වී ඇත. ඒ අනුව,

I. පළාත් ප්‍රධාන ලේකම්වරුන්
II. අමාත්‍ය මණ්ඩලයේ නොවන අමාත්‍යාංශ ලේකම්වරුන්
III. රාජ්‍ය අමාත්‍යාංශ ලේකම්වරුන්
IV. අමප අංක 18/0785/701/019 පිළිබඳව වූ 2018.05.09 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණයෙන් ආවරණය නොවන, විශ්‍රාම වැටුපට එකතු කරනු ලබන කිසිදු දීමනාවක් නොලබන SL-4 වැටුප් කාණ්ඩයට අයත්, කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් අනුමත කරන ලද තනතුරක සේවය කරනු ලබන, ජ්‍යෙෂ්ඨ විධායක ශ්‍රේණියට අයත් නිලධාරීන්
V. රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 01/1999 ට අදාළව ජනාධිපති ලේකම්වරයා හා තවත් නිලධාරීන් අමතමින් එවකට රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ ලේකම් විසින් යවනු ලැබ ඇති අංක 1/543ඊ2/30(1)අ හා 2000.01.04 දිනැති ලිපියේ සඳහන් පහත දක්වා ඇති තනතුරු දරන නිලධාරීන් ,

- භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම්වරුන්
- මැතිවරණ කොමසාරිස්
- විගණකාධිපති

03. මෙය මූලික විශ්‍රාම වැටුපට පරිභාහිරව දීමනාවක් ලෙස ගෙවිය යුතුවේ. එම දීමනාව රු.25,000 ක් වන අතර, එය සේවා කාලය පදනම් වූ ප්‍රතිශත මත ගණනය කිරීමක් නොකල යුතුය.

04. වැන්දඹු/ වැන්දඹු පුරුෂ අනත්දරු විශ්‍රාම වැටුපට මෙම දීමනාව එකතු නොකල යුතුය.

05. 2019.07.01 දින සිට මෙම දීමනාව හිමිගැන්විය යුතු අතර, ගෙවීම් කරනු ලබන දිනය අනුව හිඟ ගණනය කර අදාල විශ්‍රාමිකයාගේ ගොනුවට පිටපතක් සහිතව විශ්‍රාම වැටුප් සංශෝධනය සඳහා අනුගමනය කරනු ලබන ක්‍රමවේදය අනුගමනය කරමින් (එහි Reason සඳහා "SL-4 Special Allowance 2019" යන්න යෙදිය යුතුය) එවීමට පියවර ගත යුතු වේ.මෙහිදී විශ්‍රාම ගැන්වීමේ ලිපියේ සහතික කල පිටපතක් හා ප්‍රදාන පත්‍රයේ සහතික කල පිටපතක් Scan කර එවීමට කටයුතු කල යුතු වේ.

06. මේ පිළිබඳව යම් ගැටළුවක් මතුවන සෑම අවස්ථාවකදීම මවෙතින් පැහැදිළි කර ගැනීමක් ලබා ගැනීමට කටයුතු කල යුතු වේ.

07. මෙය ලේකම්, රාජ්‍ය පරිපාලන ආපදා කළමනාකරණ හා පශු සම්පත් සංවර්ධන අමාත්‍යාංශයේ එකඟතාවය මත නිකුත් කරනු ලැබේ.

**ඒ.ජගත් ඩී.ඩයස්**
විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල්

පිටපත් :

1. ජනාධිපති ලේකම් - කරු.දැ.ගැ.පි.
2. අග්‍රාමාත්‍ය ලේකම් - කරු.දැ.ගැ.පි.
3. අමාත්‍ය මණ්ඩලයේ ලේකම් - කරු.දැ.ගැ.පි.
4. ලේකම්, රාජ්‍ය පරිපාලන ආපදා කළමනාකරණ හා පශු සම්පත් සංවර්ධන අමාත්‍යාංශය - කරු.දැ.ගැ.පි.
5. ලේකම්, අභ්‍යන්තර හා ස්වදේශ කටයුතු සහ පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය - කරු.දැ.ගැ.පි.
6. ලේකම්, මුදල් අමාත්‍යාංශය - කරු.දැ.ගැ.පි.
7. සියළුම පළාත් ප්‍රධාන ලේකම්වරුන් හා ආණ්ඩුකාර ලේකම්වරුන් - කරු.දැ.ගැ.පි.
8. විගණකාධිපති - කරු.දැ.ගැ.පි.

ශ්‍රී ලංකා විශ්‍රාම
இலங்கை ஓய்வு
Sri Lanka Pension

**විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව , මාලිගාවත්ත, කොළඹ 10.**

**2018.01.01ට පෙර සේවය අවසන් වී ඇති අමාත්‍යාංශ ලේකම්වරුන් හා සමාන්තර වැටුප් තලයන්හි සේවය කල නිලධාරීන් වෙනුවෙන් රු.25,000ක විශේෂ දීමනාවක් විශ්‍රාම වැටුපට එකතු කිරීම සඳහා වන අයදුම්පත**

| | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| විශ්‍රාම වැටුප් අංකය | | | | | | | | | | | |
| ජාතික හැඳුනුම්පත් අංකය | | | | | | | | | | | |

---

**I කොටස - (විශ්‍රාමිකයා විසින් සම්පූර්ණ කල යුතුය.)**

1. විශ්‍රාමිකයාගේ සම්පූර්ණ නම :- ..............................................................................................
.............................................................................................................................................

2. මුලකුරු සමඟ අගට යෙදෙන නම :-
(ENGLISH BLOCK LETTERS)

3. උපන් දිනය :-

4. විශ්‍රාම ගිය දිනය :-

5. ස්ථිර පදිංචි ලිපිනය :-..............................................................................................................
.............................................................................................................................................

6. පෞද්ගලික දුරකථන අංකය :- ජංගම
නිවස

7. විශ්‍රාම යන විට සේවය කරන ලද තනතුර :- ........................................................................
වැටුප් කේතය :- ........................................................................

8. විශ්‍රාම වැටුප් චක්‍රලේඛ අංක 02/2019 ට අනුව දීමනාව හිමි වන බාණ්ඩය,

I. පළාත් ප්‍රධාන ලේකම්වරුන් ☐

II. අමාත්‍ය මණ්ඩලයේ නොවන අමාත්‍යාංශ ලේකම්වරුන් ☐

III. රාජ්‍ය අමාත්‍යාංශ ලේකම්වරුන් ☐

IV. අමප අංක 18/0785/701/019 පිළිබඳව වූ 2018.05.09 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණයෙන් ආවරණය නොවන, විශ්‍රාම වැටුපට එකතු කරනු ලබන කිසිදු දීමනාවක් නොලබන SL-4 වැටුප් කාණ්ඩයට අයත්, කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් අනුමත කරන ලද තනතුරක සේවය කරනු ලබන, ජ්‍යෙෂ්ඨ විධායක ශ්‍රේණියට අයත් නිලධාරීන් ☐

V. භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම් ☐

VI. මැතිවරණ කොමසාරිස් ☐

VII. විගණකාධිපති ☐

දිනය :- ..........................................

.............................................................
විශ්‍රාමිකයාගේ අත්සන

---

**II කොටස - (ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් සම්පූර්ණ කල යුතුය)**

9. වැටුප් විස්තරය

| | | රු | ශත |
|---|---|---|---|
| I. | මූලික වැටුප (2019.06.30 ට) | | |
| II. | ජීවන වියදම් දීමනාව | | |
| III. | වෙනත් දීමනා | | |
| IV. | විශේෂ දීමනා (අමාත්‍ය මණ්ඩලයේ තීරණය අනුව) | | |
| V. | මුළු විශ්‍රාම වැටුප (2019.07.01 ට පසු) | | |

පරීක්ෂා කළේ :- ....................................................

තහවුරු කලේ :- ..................................................
ප්‍රාදේශීය ලේකම්/ ගණකාධිකාරී

දිනය :-....................................................

දිනය :-..................................................